www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඝාතක කල්ලි කතුවරයා මරා දමා රූපවාහිනී මධ්‍යස්ථානය වනසයි

## Sri lankan death squads kill editor and ransack TV station

**කේ රත්නායක විසිනි**
**2009 ජනවාරි 13**

පසුගිය සතියේ මාධ්‍ය වෙත එල්ලකල සාහසික ප්‍රහාර දෙකෙන් සලකුනු කරන්නේ ආන්ඩුව හා මිලිටරිය එල්ටීටීඊයට එරෙහිව ගෙනයන වාර්ගික යුද්ධය පිලිබඳව සීමිත විවේචනයන් පවා නොඉවසන බවට කෙරෙන තියුනු අනතුරු ඇඟවීමකි.

ජනවාරි 8 වන දින සන්ඩේ ලීඩර් කතෘ ලසන්ත වික්‍රමතුංග මහ දවල් වෙඩිතබා ඝාතනය කරන ලද්දේ තදබදය සහිත අතුරු මාර්ගයක් දිගේ සිය මෝටර් රියෙන් වැඩට යමින් සිටියදීය. ඇසින් දුටුවන් පවසන්නේ මුහුනු ආවරනය කරගත් යතුරු පැදිවල නැඟුනු තුවක්කුකරුවන් ඔහුගේ මෝටර් රිය වෙත පැමිනි බවයි. එක් අයෙකු මෝටර් රියේ මාර්ගය අවහිර කල අතර අනෙකා ඉදිරිපස වීදුරුව සිදුරු කර පිස්තෝලයකින් වික්‍රමතුංගට වෙඩි තැබීය. තවත් දෙදෙනෙක් රැකවල් ලා සිටියහ. මෙම ස්ථානය අධි ආරක්ෂිත කලාපයට යාබදව හා ගුවන් හමුදා මාර්ග බාධකයට මීටර් 100 ක් නුදුරින් පිහිටිය ද සිව්දෙනාම පලාගියහ.

දෙදිනකට පෙර හිම්දිරියේ සිරස-එම්ටීවී විකාශන ජාලය වෙත කඩාවැදුනු සන්නද්ධ කල්ලියක් මුරකරුවන් කොටුකර තබා ගොඩනැගිල්ල වනසා දැමූහ. ස්වයංක්‍රීය ගිනිඅවි, පිස්තෝල, අත්බෝම්බ හා ක්ලේමෝ බෝම්බවලින් සන්නද්ධව සිටි 20 දෙනෙකුගෙන් පමන සමන්විත මුහුනු ආවරන පැලඳ සිටි මැරයෝ පාලක මැදිරිය විනාශකර ඡායාරූප මැදිරි හා කාර්යාලවලට වෙඩි තැබූහ. පොලිසියට දැනුම්දී තිබුන ද පැය භාගයක් පුරා කරගෙන ගිය ප්‍රහාරය අවසන්වන තෙක්ම ඔවුන් එහි නොපැමිනියහ. *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* වෙත ප්‍රකාශයක් කල ප්‍රවෘත්ති අධ්‍යක්ෂ අශෝක ඩයස් ''මාධය නිදහසට එල්ලකල ප්‍රහාරයක්'' ලෙස මෙය හෙලා දුටුවේය.

පසුගිය තෙවසර පුරා රටේ දෙමල සුලුතරයට ද ආන්ඩුව හා යුද්ධය පිලිබඳව විවේචනශීලීවූ කවරෙකුට හෝ එරෙහිව එල්ලකල සියගනනක් ප්‍රචන්ඩ ප්‍රහාරයන්, ඝාතන හා පැහැරගෙනයාම් සඳහා වගකිවයුතු මිලිටරියේ අනුග්‍රහය ලත් මැර කල්ලි විසින් සිදුකල ප්‍රහාරයන්හි සලකුනු මෙම සිදුවීම් දෙක තුලම දක්නට ඇත. පසුගිය සතියේ මෙම ප්‍රහාරයන් සිදුවූයේ ඊට කලින් සතියේ හමුදාව එල්ටීටීයේ කිලිනොච්චි මූලස්ථානය අල්ලාගැනීමත් සමඟ ජනාධිපති රාජපක්ෂ ප්‍රතිගාමී ජයඝෝෂා රැල්ලක් උසිගැන්වීමෙන් පසුව ය.

වික්‍රමතුංගගේ ඝාතකයන්ට පලායෑමට හැකිවීමත් මනාව සන්නද්ධවූ තුවක්කුකරුවන් 20 දෙනාට කිසිදු බාධාවකින් තොරව රාත්‍රි කාලයේ සැරිසැරීමට ඉඩ ලැබීමත් යන දෙකෙන්ම පෙන්නුම් කරන්නේ ආරක්ෂක හමුදාවන්ගේ මඟහැරීමයි. පොලිසිය ද මිලිටරිය ද කොලඹ හා තදාසන්න ප්‍රදේශවල මාර්ග බාධක හා පරීක්ෂන මුරකපොලු සහිත දැවැන්ත මෙහෙයුම් ජාලයක් පවත්වාගෙන යයි. වාහන, මඟීන් පමනක් නොව පදිකයන් පවා නතරකර නිරන්තරව පරීක්ෂාවට බඳුන්කෙරෙයි. තව ද සිරස-එම්ටීවී ප්‍රහාරකයන් ගමන්ගත්තේ ශ්‍රී ලංකාව තුල දශක ගනනාවක් තිස්සේ මිලිටරි ඝාතක කල්ලිවල ලාංඡනය බවට පත්ව ඇති නොම්මර තහඩු නොමැති සුදු වෑන් රථයකිනි.

වික්‍රමතුංගගේ මරනය පිලිබඳව ආන්ඩුවට චෝදනාකරමින් සටන් පාඨ හඬනැඟූ දහස් ගනනක් 12 දින කොලඹ පැවති ඔහුගේ අවමංගල්‍යයට සහභාගී විය. පැරීසිය මූලස්ථානය කරගත් දේශසීමාවන්ට නොබැඳුනු මාධ්‍යකරවෝ (ආර්එස්එෆ්) නම් සංවිධානය පසුගිය ඔක්තෝබරයේදී ජනාධිපති විසින් ඔහු ''ත්‍රස්තවාදී මාධ්‍යකරුවෙකු'' ලෙස හංවඩු ගැසීම පිලිබඳව ද සඳහන් කරමින් කතෘවරයාට එරෙහිව වෛරය ඇවිස්සීම ගැන ආන්ඩුවට චෝදනා කලේය. ඝාතනය හෙලාදකිමින් නිකුත් කල සිය ප්‍රකාශනය තුල ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය රාජපක්ෂගේ පාලන කාලය තුල මාධ්‍යකරුවන් ද ඇතුලු මාධ්‍ය සේවකයන් 14 දෙනෙකු ඝාතනය කර ඇති බවත් 20 දෙනෙකු තර්ජන හේතුකොට ගෙන රට හැර පලාගිය බවත් පෙන්වා දුන්නේය.

කොලඹ මාධ්‍ය සංස්ථාපිතයේ අනෙකුත් කොටස් එල්ටීටීඊයට එරෙහි යුද්ධයට සිය පිටුබලය දුන් ආකාරයට ම, තත්වාරක්ෂක විරුද්ධ පක්ෂය වන එක්සත් ජාතික පක්ෂය (එජාප) සමඟ වික්‍රමතුංග සමීපව කටයුතු කලේය. කෙසේ වුව ද ඒ සමඟම වික්‍රමතුංග යුද්ධය කෙරීගෙන යන ආකාරය පිලිබඳව

ආන්ඩුව හා ආරක්ෂක අංශයේ ඉහල නිලධරය විවේචනයට ලක්කලේය. ප්‍රමුඛ ජෙනරාල්වරුන්ගේ හා ඇමතිවරුන්ගේ ඉහල මට්ටමේ දූෂනයන්ට අදාල සිදුවීම් සන්ඩේ ලීඩර් තුලින් හෙලිදරව් කර තිබුනි.

ජනාධිපතිගේ සහෝදරයෙකු වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ අපහාස කිරීමේ චෝදනාව යටතේ වික්‍රමතුංගට එරෙහිව පවරා තිබූ නඩුව දිස්ත්‍රික් අධිකරනයේ විභාග වෙමින් තිබුනි. ආරක්ෂක ගනුදෙනුවක් තුල අඩංගු දූෂනයන් හෙලිදරව් කරන සන්ඩේ ලීඩර්හි පලවූ ලිපියක් සම්බන්ධයෙන් පවරා තිබූ නඩුවෙන් ගෝඨාභය රාපක්ෂ රුපියල් කෝටි 100 අලාභයක් ඉල්ලා තිබුනි.

ඒ සමගම පාර්ලිමේන්තුව මගහැර මිලිටරිය මත පදනම්වීම ද ඇතුලුව රාජපක්ෂගේ එන්ට එන්ටම වැඩිවන ආඥාදායක පාලන විධික්‍රම පිලිබඳව කොලඹ ප්‍රභූ පැලැන්තියේ කොටස් අතර පවතින කනස්සල්ල ද වික්‍රමතුංගගේ විවේචන තුල පිලිඹිඹු විය. තමා ඉලක්කයක්ව සිටින බව මනාව දැන සිටි වික්‍රමතුංග පසුගිය සති අන්ත සන්ඩේ ලීඩර් හි කතුවැකිය ලෙස පලකල තමාගේම මරන දැන්වීම ලියා තැබීය. එහිදී ඔහු ශ්‍රී ලංකාව සමානකර තිබුනේ නාසි ජර්මනියටය.

එහිදී කෙලින්ම ජනාධිපති ආමන්ත්‍රනය කල වික්‍රමතුංග, දෙදෙනා මීට කලින් දිගුකාලීන මිතුරන්ව සිටි බව සඳහන් කරයි. ''මාගේ මරනය හමුවේ ඔබ (රාජපක්ෂ) සාමාන්‍යයෙන් කරන පරිදි උපාසක හඬ නගමින් වහාම හා පූර්න පරීක්ෂනයක් පවත්වන ලෙසට පොලිසියට නියම කරනු ඇති බව මම දනිමි. එහෙත් අතීතයේදී ඔබ නියෝග කල සියලු පරීක්ෂනවලදී මෙන්ම මෙහිදී ද කිසිවක් සිදු නොවනු ඇත. ඇත්ත කථාකලහොත් මාගේ මරනය පිටුපස සිටිනු ඇත්තේ කවුරුන් ද යන වග අපි දෙදෙනාම දන්නෙමු.......

''ඔබගේ තරුන අවධියේදී රට පිලිබඳව ඔබට තිබුනු සෑම සිහිනයක්ම යාන්තම් තෙවසරක් තුලදී ඔබ කීතු කර දමා තිබීම කනගාටුවට කරුනකි. දේශප්‍රේමීත්වයේ නාමයෙන් ඔබ මානව අයිතීන් පාගාදැමීය. සීමාන්තික දූෂනය වගාකරමින් මීට පෙර කිසිදු ජනාධිපතිවරයෙකු නොකල පරිදි මහජන මුදල් කොල්ලකෑවේය. ඔබ තරම් (වෙනත් කිසිවෙකුත්) මේ භූමිය මත මෙතරම් ලේ වැගිරවීමට හෝ ඔබ තරම් පුරවැසියන්ගේ අයිතීන් පෑගීමට කටයුතු කර නැත.''

දශක ගනනාවක් තිස්සේ ප්‍රජාතනත්‍රීය අයිතීන් පෑගීමටත් ලේ වැගිරවීමටත් කටයුතු කර තිබෙන ආන්ඩු පැවති ශ්‍රී ලංකවේ සන්දර්භය තුල ගත් විට පවා හිටපු මිතුරෙකු (රාජපක්ෂගේ) විසින් ලියන ලද කතුවැකිය රාජපක්ෂ තන්ත්‍රයට එල්ලවූ අසාමාන්‍ය චෝදනාවකි. රාජපක්ෂ යටතේ, 2002 සටන් විරාමය බිඳ දමා වාර්ගික යුද්ධය යලි දියත් කල හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන් අමුඅමුවේ උල්ලංඝනය කිරීම යුක්තිසහගත කිරීම සඳහා එය ගසාකෑ දේශපාලන-මිලිටරි කල්ලියක් අතට පෙර නොවූ විරූ පරිදි බලය සංකේන්ද්‍රනයවී තිබේ. වික්‍රමතුංග කථා කලේ එවන් ක්‍රමවේදයන් අවසානයේදී වැඩකරන ජනතාවගේ දැවැන්ත ප්‍රති ප්‍රහාරයක් අවුලුවනු ඇතැයි තැතිගැන්මට පත් දේශපාලන සංස්ථාපිතයේ කොටස් වෙනුවෙනි.

සිරස-එම්ටීවී ප්‍රශ්නයේදී ආන්ඩුව විරුද්ධ එජාපයට චෝදනා කිරීමට වෑයම් කරමින් තවත් පියවරක් ඉදිරියට ගත්තේය. පොලිසිය නිර්නාමික ඔත්තුවක් මත කටයුතු කරන බව අඟවා එජාපයේ නාගරික මන්ත්‍රීවරයෙකු අත් අඩංගුවට ගත්තේ ප්‍රහාරයට සම්බන්ධ ගිනි අවි ගෙනයාමට උදව් කල බවට එල්ල කල චෝදනාවක් යටතේය. ආන්ඩුව හෝ පොලිසිය යන කවරෙකු වත් රාජපක්ෂ පිලිබඳව විවේචනශීලී වූ රූපවාහිනී මධ්‍යස්ථානයක් වනසා දැමීම සඳහා මන්ත්‍රීවරයා හෝ එජාපය සම්බන්ධ වූයේ මන්ද යන්න ගැන කිසිදු පැහැදිලි කිරීමක් කර නැත.

ප්‍රහාරය සිදුවූයේ ආන්ඩුවට-සම්බන්ධ මාධ්‍යයන් සිරස-එම්ටීවී හි ''දේශද්‍රෝහී'' ආකල්පය ගැන එය හෙලාදකින අතරතුරය. ආන්ඩුවේ හොරනෑ හඬ නැගුවේ මාධ්‍ය ජාලයේ විකාශනයෙන් හමුදාවේ කිලිනොච්චි ජයග්‍රහනයට සැලකිය යුතු ආවරනයක් නොදුන් බව හා එදිනම කොලඹදී සිදුකල මරාගෙන මැරෙන එල්ටීටීඊ බෝම්බ ප්‍රහාරයට අනවශ්‍ය ප්‍රමුඛත්වයක් දුන් බවය. සන්ඩේ ලීඩර් මෙන්ම සිරස-එම්ටීවී ද යුද්ධයට මුලුමනින්ම සහාය දුන් නමුත් ආන්ඩුවේ දූෂන හා අක්‍රමිකතාවන් ගැන විවේචනශීලී විය.

එල්ටීටීඊයට එරෙහිව හමුදාවේ ජයග්‍රහන පිලිබඳ සියලු ජයඝෝෂා තිබියදීම සිරස-එම්ටීවී ප්‍රහාරයෙන් ද වික්‍රමතුංගගේ ඝාතනයෙන් ද පෙන්නුම් කෙරෙන්නේ රාජපක්ෂ තන්ත්‍රය කෙතරම් දුබල ද යන්නය. පසුගිය සිකුරාදා හමුදාව මූලෝපායිකව වැදගත් අලිමංකඩ අල්ලාගැනීම ජාතික රූපවාහිනියෙන් නිවේදනය කරමින් සුපුරුදු පරිදි '' ජනතාවගේ අවධානය වෙනත් දිසාවකට යොමු කිරීම සඳහා මෙම ජයග්‍රහන ලඝුකොට දක්වන'' කුමන්ත්‍රනකරුවන් ගැන කථා කලේය.

''මෙම කුමන්ත්‍රනකරුවන්ගේ අරමුන මෙම ජයග්‍රහන අත්කර ගැනීම වෙනුවෙන් ඉමහත් කැපකිරීමකින් කටයුතු කරන හමුදාපතිට එරෙහිව බොරු චෝදනා එල්ලකිරීම ය'' යි රාජපක්ෂ ප්‍රකාශ කලේය. ''ඔවුන් හමුදාවන්ගේ චිත්ත ධෛර්යය විනාශකර රට අස්ථාවර භාවයට පත්කිරීමේත් අප ලබාගත් ජයග්‍රහන අපගෙන් උදුරාගැනීම සඳහා විවිධ ජාත්‍යන්තර බලවේගයන්ට ඉඩ සලසා දීමේත්'' උත්සාහයක නිරතව සිටියි.

කුමන්ත්‍රනකරුවන් හෙලිකිරීමට හෝ මෙම කුමන්ත්‍රනය පිලිබඳ කිසිදු පිලිගතහැකි විස්තරයක්

ඉදිරිපත් කිරීමට රාජපක්ෂ අසමත් වීම පුදුමයට කාරනයක් නොවේ. සියල්ලටත් වඩා ඔහුගේ පීඩනෝන්මාදය පිලිඹිබු කරන්නේ යුද්ධයේ බරට කරගැසීමට බලකෙරී ඇති හා ගෝලීය ආර්ථික පසුබෑමේ ප්‍රතිපලයක් වශයෙන් ජීවන කොන්දේසි තවදුරටත් කඩාවැටීමට මුහුනපා සිටින වැඩකරන ජනතාවගේ පුලුල් කොටස් පිලිබඳ භීතියයි.

හමුදාවේ ජයග්‍රහන කෙරෙහි පුලුල්ව පැතිරුනු ජනතා උද්යෝගයක් පලවූයේ නැත. ආන්ඩුවේ නියෝග මත පාසැල් ද ඇතුලු රජයේ ආයතනවලට කිලිනොච්චි ජයග්‍රහන ''සැමරීමට'' බලකෙරුනි. විවිධ සිංහල ස්වෝත්තමවාදී සංවිධාන සාපේක්ෂව කුඩා රැස්වීම් පැවැත්වූහ. එහෙත් සැලකියයුතු ව්‍යාකූලත්වයක් පැවතියේ වුව ද වැඩකරන ජනතාව අතර ඇත්තේ විසිපස් වසරක සිවිල් යුද්ධය ඉක්මනින් නිමාවට පත්වී ජීවිතය යහපත් වනු ඇතැයි යන හුදු බලාපොරොත්තුවයි.

ආන්ඩුවට සාක්ෂාත් කල නොහැක්කේ ද හරියටම මෙම අපේක්ෂාවන් ය. වික්‍රමතුංගගේ ඝාතනය මධ්‍යයේ පැමිනි රාජපක්ෂගේ ''කුමන්ත්‍රනකරුවන්'' පිලිබඳ ග්‍රස්තිය වනාහි ඕනෑම විරුද්ධත්වයක් මැඩීම සඳහා යොදාගනු ඇති පියවරයන් පිලිබඳ හැකි තියුනුම අනතුරු ඇඟවීමයි. එල්ටීටීඊයේ ඉතිරි බල කඳවුරු ද හමුදාව අත්පත්කර ගත්තත් කිලිනෝච්චිය වැටීමෙන් පසුව රාජපක්ෂ ප්‍රකාශකල පරිදි මෙම ''ජයග්‍රහනය සාමය, නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය'' උදා නොකරනු ඇති අතර කම්කරු පන්තියට එරෙහිව පොලිස්-රාජ්‍ය මර්ධනය එල්ලකරනු ඇත. .

© www.wsws.org